දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 08 /2016

බන්ධනාගාර මුලස්ථානය,
කොළඹ 09,

2016.01.25.

සියළුම බන්ධනාගාර අධිකාරි /සහකාර අධිකාරි වෙත,

- දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග විධිවිධානයන්ට වැඩිමනත් වශයෙනි.

<u>ආයතන තුල ආරක්ෂක විධිවිධාන</u>

ඔබ ආයතනයේ දැනට ක්‍රියාත්මක වන ආරක්ෂක සංවිධාන අනුව විශේෂ ඝණයේ සිරකරුවන් (මරණ දන්ඩණය /මරණ දන්ඩණ අභියාචක ) හා දිර්ඝ කාලින සිරකරුවන්, විශේෂ ගණයේ සැකකරුවන් රඳවා ඇති විශේෂ සිර මැදිරි සෝදිසි කිරීම් වලදී ජංගම දුරකථන ඇතුළු තහනම් ද්‍රව්‍ය වැඩි වශයෙන් අත්අඩංගුවට ගැනීම් සිදුවන බවට මා වෙත කරුණු වාර්ථා වේ. ඒ අනුව මින් ඉදිරියට විශේෂ ඝණයේ සිරකරුවන් හා සැකකරුවන් රැඳවීමේ දී ද එම සිර මැදිරි හා සිර කුටි සෝදිසි කිරීමේදී ද පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව කටයුතු කල යුතුය.

**1.විශේෂ ඝණයේ සිරකරුවන්/සැකකරුවන් රඳවා තැබීම.**

මරණ දණ්ඩනය නියමව හා මරණ දණ්ඩන අභියාචක සිරකරුවන්ද දීර්ඝ කාලීන සිරකරුවන් හා විශේෂ ඝණයේ සිර/සැකකරුවන්, දීර්ඝ කාලයක් එකම සිර කුටියක් හෝ සිර මැදිරියක් තුල රඳවා තැබීම අත් අඩංගුවෙන් පැනයාම් හා විනය විරෝධි කටයුතු වල යෙදීම් සඳහා හේතු සාධක විය හැකි බැවින් ඉහත සඳහන් සිරකරුවන් හා සැකකරුවන් රඳවා තැබෙන සිර කුටි තුල දීර්ඝ කාලීනව රඳවා තැබීමක් සිදු නොකොට නිශ්චිත කාල පරිච්ඡේදයක් තුල එම සිර මැදිරි මාරු කිරීම නියමිත ක්‍රමවේදයකට අනුව සිදු කිරීමට කටයුතු කලයුතුය. මේ ආකාරයට විශේෂ ඝණයේ සිර/සැකකරුවන් මාරු කිරීම සම්බන්ධයෙන් හා ආරක්ෂක සංවිධාන සම්බන්ධයෙන් අධිකාරි වරයාගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදු කල යුතුය.

**2.විශේෂ සිර මැදිරි හා සිරකුටි සෝදිසි කිරීම**

i. මරණ දන්ඩණය, මරණ දන්ඩන අභියාචක, දිර්ඝ කාලින සිරකරුවන් හා විශේෂ ඝණයේ සිර/ සැකකරුවන් රඳවා තැබෙන සිරමැදිරි භාරව ජේලර් වරයෙකු දෛනිකව යෙදවීමට කටයුතු කල යුතු අතර එම ජේලර් වරයාගේ අධීක්ෂණය යටතේ දෛනිකව සිදු කෙරෙන සෝදිසි කිරීම්, නියමිත නියෝග ප්‍රකාරව අඛණ්ඩව සිදුකල යුතුය. තවද දෛනික වශයෙන් සිර මැදිරි, සිරකුටි වල සිදු කෙරෙන සෝදිසි කිරීම් වලට අමතරව විශේෂ හා හදිසි සෝදිසි කිරීම් අවස්ථාණුකූලව විධිමත් අයුරින් සිදු කිරීමට කටයුතු කල යුතුය.

ii. අංශභාර ජේලර් වරුන් විසින් සිදු කෙරෙන සෝදිසි කිරීම් සම්බන්ධයෙන් වූ සියළු තොරතුරු අඩංගු ලේඛණයක් පවත්වාගෙන යාමට කටයුතු කලයුතු වන අතර දැනට දෙසතියකට වරක් බන්ධනාගාර මූලස්ථානය වෙත යොමු කෙරෙන සෝදිසි සම්බන්ධයෙන් වූ වාර්ථා මසකට වරක් ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

iii. යම් සිරමැදිරි/ සිරකුටි හෝ බන්ධනාගාර භූමි විශේෂ සෝදිසියට ලක් කිරිමට අවශ්‍ය වන අවස්ථාවන් හා එසේ විශේෂ සෝදිසියට ලක්කල යුතු බවට නියෝග කොට එම සෝදිසි කිරීම් කල පසුව එම සෝදිසිය සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස් (ක්‍රියාකාරී/ බුද්ධි හා ආරක්ෂක) වෙත ක්ෂණිකව දැනුම්දීමට කටයුතු කල යුතු වේ.

iv. ආයතනය තුල සිදු කෙරෙන විශේෂ සෝදිසි සඳහා බන්ධනාගාර බුද්ධි හා ආරක්ෂක ඒකකයේ නිලධාරින්ගේ සහය ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, බන්ධනාගාර කොමසාරිස් (බුද්ධි හා ආරක්ෂක) අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්,

බන්ධනාගාර මූලස්ථානය.

**එච්.එම්.එන්.සී. ධනසිංහ**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**